**GMOA**
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

12/11/2012

## මාධ්‍ය නිවේදනයයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කවුන්සිලයට සභිකයින් දෙදෙනෙකු පත්කර ගැනිම සඳහා පැවැත්වෙන මැතිවරණය නොවැම්බර් 12 සිට 16 වෙනිදා දක්වා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේදි පැවැත්වේ.

මේ වන විට ශ්‍රී ලංකාව තුල වෛද්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය පිළිබඳ අර්බුදකාරී තත්ත්වයක් පවති.

ශ්‍රී ලංකාව තුල වෛද්‍ය සේවයේ සහ වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය නියාමනය කරනු ලබන ඉහළම ආයතනය වන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වන අතර එහි සභිකයින් එල්ල කරගෙන සිදු කරන ලද හිරිහැර කිරීම් ගණනාවක්ම මෑත කාලයේදි වාර්තා විය.

මෙම අර්බුද හමුවේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්වාධීනත්වය රැක ගැනිම, වෛද්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනිම සඳහා ඉතාම වැදගත් වේ.

මේ අනුව මෙම අභියෝග ජය ගැනිම සඳහා ඉහත සඳහන් මැතිවරණයට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් නිලධාරින් දෙදෙනෙකු නම් කරන ලදි.

**වෛද්‍ය බී.වී.ඩී.එස්.පි අබේවර්ධන**

ජ්‍යෙෂ්ඨ ළමා රෝග විශේෂඥ වෛද්‍ය, ප්‍රාදේශිය මහ රෝහල, රත්නපුර
රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ භාරකාර කමිටුවේ සභික

**වෛද්‍ය එම්.එල්.ඩී.එස්.එස් අබේවර්ධන**

ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී, කොළඹ ජාතික රෝහල
රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මධ්‍යම කාරක සභාවේ සභික

14,000 කට අධික රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ සාමාජිකයින් ඉහත නිලධාරින් දෙදෙනාගේ ජයග්‍රහනය වෙනුවෙන් සහය පලකර ඇත.

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වැඩිදුර විස්තර :-

වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නලින්ද හේරත් 0717876516
වෛද්‍ය නවීන් සොයිසා 0718582444